1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/13/CIR.COM.(2) | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.01.22 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව බාහිර චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/EST/1/1/01-2025 හා 2025.01.17 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.01.16 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය | 11/2024 (රාජ්‍ය පරිපාලන) | 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යුනිකෝඩ් හා අනුකූල අක්ෂර (Unicode Compatible Fonts) භාවිතා කිරීම |

03. ඒ අනුව, මේ පිළිබඳව ඔබ ආයතනයේ සහ ඔබ යටතේ පවතින අදාළ ආයතනයන්හි අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

අනිල් වික්‍රමසේකර,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
දකුණු පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 11/2024

මගේ අංකය : EST-1/CIRL/03/0001
අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.11.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා**
**යුනිකේත හා අනුකූල අක්ෂර (Unicode Compatible Fonts) භාවිතා කිරීම**

උක්ත කරුණට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් නියමය පරිදි එවකට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් නිකුත්කර ඇති අංක MWCA&SE/NSPD/Legal CC 1/SC-FR-177-2023 හා 2024.08.30 දිනැති ලිපිය වෙත අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය ආයතන විසින් පරිගණක ලේඛන සකස් කිරීමේ දී සහ වෙබ් පිටු පවත්වාගෙන යාමේ දී එකිනෙකට වෙනස් වූ කේතගත අක්ෂර මාලා ක්‍රම භාවිතා කිරීම හේතුවෙන් එම පරිගණක ලේඛන හා වෙබ් පිටු පරිහරණය කරන දෘශ්‍යාබාධිත තැනැත්තන්ට ගැටලු ඇතිව ඇති බව එහි දක්වා ඇත.

03. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් ලිපි ලේඛන සකස් කිරීමේ දී හා වෙබ් පිටු පවත්වාගෙන යාමේ දී දෘශ්‍යාබාධිත තැනැත්තන්ට ද භාවිතා කළ හැකි ආකාරයට යුනිකේත හා අනුකූල අක්ෂර (Unicode Compatible Fonts) උපයෝගී කරගෙන භාෂා ත්‍රිත්වයෙන්ම අදාළ පරිගණක ලිපි හා වෙබ් පිටු සකස් කළ යුතු ය. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිළිගත් යුනිකේත හා අනුකූල අක්ෂර සහිත පරිගණක මෘදුකාංග නිමවුම් භාවිතයට යොදා ගත හැකි ය.

04. එසේම රජයේ මුද්‍රණාලය වෙත මුද්‍රණය වෙනුවෙන් ඉදිරිපත් කරන සියලුම ලේඛන සහ දැන්වීම් ද යුනිකේත හා අනුකූල අක්ෂර යොදා සකස් කර PDF සහ Word ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය.

05. මේ පිළිබඳව මීට ඉහත දී ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති 2007.03.14 දිනැති චක්‍රලේඛ අංක SP/SB/01/07 කෙරෙහි ද අවධානය යොමු කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
අධිකරණ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-i@pubad.gov.lk

11/2024
නිකුත් කළ
2025.01.16
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම්
එච්.ඩී.ඩී.එස්.ඩබ්.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය